දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister } 2784832, 2784807, 2785617

ලේකම් / செயலாளர் / Secretary } 2784812

කාර්යාලය / அலுவலகம் / Office } 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
"இசுருபாயா"
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

ඔබේ අංකය / உமது இல. / Your No. } .....

මගේ අංකය / எமது இல. / My No. } ED/04/60/01/15/V(I)

දිනය / திகதி / Date } 2017.01.17

අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක: 7/2017

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ විදුහල්පතිවරුන් සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරුන් අතුරින් වැටුප් වර්ධක ගැලපුම් දීමනාවක් ලබමින් සිටින නිලධාරීන්ගේ වැටුප රා.ප.ච.03/2016 අනුව පරිවර්තනය කළ යුතු ආකාරය

2005.12.31 දිනට ලද වැටුප් වර්ධකයේ අගය අඩුවීම වැළැක්වීම සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 හි 19(ඉ)ඡේදය අනුව ගැලපුම් දීමනාවක් ලබමින් සිටි ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරීන්ගේ එම වැටුප් වර්ධක ගැලපුම් දීමනාව 2016.01.01 දින සිට ගෙවිය යුතු ආකාරය දන්වන ලද 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි 4.3 වගන්තිය කෙරෙහි අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 31/2011 සහ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2012 යටතේ ගෙවනු ලැබූ විශේෂ දීමනාව ගණනය කිරීමේදී ඉහත පරිදි ගෙවනු ලැබූ වැටුප් වර්ධක ගැලපුම් දීමනාවද අදාළ කර ගනු ලැබ ඇත.එබැවින් විශේෂ දීමනාවෙහි එම කොටසද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි උපලේඛන II හි සඳහන් මූලික වැටුපට සහ එහි සඳහන් ගැලපුම් දීමනාවට අමතරව ගෙවිය යුතුය.අමතර වශයෙන් ගෙවිය යුතු එම දීමනාව ගෙවිය හැක්කේ උපලේඛන IIහි සඳහන් ගැළපුම් දීමනාව හිමිවන දිනය දක්වා පමණි.

උදා:- 2015.12.31 දිනට GE-2-2006 වැටුප් පරිමාණයේ රු.34,005/- ක වැටුප් තලය සහ රු.840/-ක ගැලපුම් දීමනාවක් ලබමින් සිටි නිලධරයෙකු සම්බන්ධයෙන් ගෙවීම් කළ යුත්තේ මෙසේය.

(ආ) 2015.12.31 දිනට ලද වැටුප හා දීමනා

මූලික වැටුප	රු. 34,005
විශේෂ දීමනාව(20%)	රු. 6801 (මූලික වැටුපෙන් 20%)
ගැලපුම් දීමනාවේ එකතුව	රු. 840
විශේෂ දීමනාව(20%)	රු. 168 (ගැලපීමේ දීමනාවෙන්20%)
අන්තර් දීමනා	රු 10,000
එකතුව	රු. 51,814

(ආ) 2016.01.01 දින සිට ගෙවිය යුතු වැටුප් හා දීමනා

මූලික වැටුප	රු. 41,267
වැටුපෙහි ගැලපීම දීමනාව	රු. 9,539
වැටුප් වර්ධක ගැලපීමේ දීමනාවේ එකතුව	රු. 840
විශේෂ දීමනාව(20%)	රු. 168
එකතුව	රු. 51,814

(ඇ) 2017.01.01 දින සිට ගෙවිය යුතු වැටුප් හා දීමනා (වැටුප් වර්ධකය උපයාගෙන ඇත්නම්)

මූලික වැටුප	රු. 49,450
වැටුපෙහි ගැලපීම දීමනාව	රු. 2,130
වැටුප් වර්ධක ගැලපීමේ දීමනාවේ එකතුව	රු. 840
විශේෂ දීමනාව(20%)	රු. 168
එකතුව	රු. 52,588

(ඈ) 2018.01.01 දින සිට ගෙවිය යුතු වැටුප් හා දීමනා (වැටුප් වර්ධකය උපයාගෙන ඇත්නම්)

මූලික වැටුප	රු. 57,909
වැටුප් වර්ධක ගැලපීමේ දීමනාවේ එකතුව	රු. 840
එකතුව.	රු. 58,749

2018.01.01 දින සිට මූලික වැටුපට අමතරව ගැලපීමේ දීමනාවක් හිමි නොවන බැවින් වැටුප් වර්ධක ගැලපීමේ දීමනාව මත ගණනය කර ගෙවන ලද 20% විශේෂ දීමනාවද එදින සිට නොගෙවිය යුතුය.

03. ශ්‍රී ලංකා ගුරු සේවයේ සිට ශ්‍රී ලංකා විදුහල්පති සේවයට පත්වීම් ලැබීම මත වැටුප් වර්ධකයේ මූල්‍යමය අගය අඩුවන අවස්ථාවකදී ක්‍රියාකළ යුතු ආකාරය සම්බන්ධව අංක 3/2014 චක්‍රලේඛය මඟින් උපදෙස් නිකුත් කරනු ලැබ ඇත.ඒ අනුව 2015.12.31 දිනට වැටුප් වර්ධක ගැලපුම් දීමනාවක් හිමිව තිබූ නිලධරයෙකු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 31/2011 හා 18/2012 යටතේ එම ගැලපුම් දීමනාවට අදාළව හිමි වූ විශේෂ දීමනාවද ඉහත පරිදි ගණනය කර ගෙවිය යුතුය.මෙම දීමනාව ගෙවිය යුත්තේද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි ඇමුණුම II හි සඳහන් ගැලපීමේ දීමනාව හිමිවන දිනය දක්වා පමණි.

04. ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ සහ ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ එකඟතාවය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

සුනිල් හෙට්ටිආරච්චි
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය